## ඉතිහාසය - I පත්‍රය

### පිළිතුරු සඳහා මග පෙන්වීම

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|
| (1) | 3 | (21) | 4 |
| (2) | 2 | (22) | 2 |
| (3) | 4 | (23) | 2 |
| (4) | 2 | (24) | 2 |
| (5) | 1 | (25) | 2 |
| (6) | 1 | (26) | 3 |
| (7) | 3 | (27) | 2 |
| (8) | 3 | (28) | 1 |
| (9) | 1 | (29) | 4 |
| (10) | 4 | (30) | 3 |
| (11) | 3 | (31) | 1 |
| (12) | 4 | (32) | 4 |
| (13) | 3 | (33) | 4 |
| (14) | 1 | (34) | 2 |
| (15) | 2 | (35) | 2 |
| (16) | 1 | (36) | 2 |
| (17) | 2 | (37) | 3 |
| (18) | 1 | (38) | 3 |
| (19) | 4 | (39) | 1 |
| (20) | 4 | (40) | 1 |

[ 2 වැනි පිටුව බලන්න



## අ.පො.ස. (සා.පෙළ) උපකාරක සම්මන්ත්‍රණය - 2013

### ඉතිහාසය - II පත්‍රය

### පිළිතුරු සඳහා මග පෙන්වීම

1. අ. (I)




එක ස්ථානයකට ලකුණු 1 බැගින් 1 × 10 = 10

[3 වැනි පිටුව බලන්න



අ.පො.ස. (සා.පෙළ) උපකාරක සම්මන්ත්‍රණය - 2013

1. අ. (II)




එක ස්ථානයකට ලකුණු 1 බැගින් 1 × 08 = 08

[4 වැනි පිටුව බලන්න



### I කොටස "ආ"

1. ආ. (i) A - මුල්ලේරියා වෙල (මුල්ලේරියාව)
   B - කොන්ස්තන්තිනෝපලය
   C - ලංකාපටුන
   D - ශ්‍රී පාදය, සමනළ මුදුන (1 × 4 = 4)

(ii) 1. හෙන්රි ස්ටීල් ඕල්කොට්තුමා
2. ඇමරිකානු ජාතිකයෙකි
3. පරම විඥනාර්ථ සමිතිය
4. ආනන්ද, නාලන්ද, ධර්මරාජ, මහින්ද යන බෞද්ධ පාසල් (1 × 4 = 4)

(iii) 1. ගැලීලියෝ ගැලීලි
2. ඉතාලි ජාතිකයෙකි
3. දුරදක්නය / දුරේක්ෂය
4. අත්හදා බැලීමේ පියා 1 × 4 = 4)

### II කොටස

2. (i) යක්ෂ, දේව, නාග, රාක්ෂ (1 × 3 = 3)

(ii) A - මල්වතු ඔය / කදම්බ නදී / අරවි ආරු
B - ගෝණ නදී / කලා ඔය
C - මහාවාලුකා නදී / මහවැලි ගඟ
D - කරින්ද නදී / කිරිඳි ඔය. (1 × 4 = 4)

(iii)
- මූලික වශයෙන් කෘෂිකාර්මික කටයුතුවල නිරත වීම. හෝග වගාව, සත්ව පාලනය හා වෙළඳාම
- දෛනික ජීවිතයට අවශ්‍ය කෘෂි උපකරණ, ගෘහ උපකරණ හා වෙනත් මෙවලම්, රෙදිපිළි, ගම් මට්ටමින් නිපදවා ගැනීම.
- භාණ්ඩ හුවමාරුව.

කරුණු 2 ක් සඳහා ලකුණු 02
පැහැදිලි කිරීම ලකුණු 03
මුළු ලකුණු 05

(iv)
- ජනතාවගේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගය වූ වී වගාව සඳහා සම්පාදිත ජලය වඩා ඵලදායී ලෙස යොදා ගත හැකි වීම.
- ගංගා ජලය වී වගා කටයුතු සඳහා ප්‍රමාණවත් නොවීම.
- වර්ෂාව අවුරුද්දේ එක් කාලයකට සීමා වීම.
- ලැබෙන වර්ෂාපතනය ප්‍රමාණවත් නොවීම.
- වර්ෂාව අවිනිශ්චිත වීම.
- ජන සංඛ්‍යාව වැඩිවීම නිසා වගාබිම් පුළුල් වීම.

කරුණු 3ක් සඳහා ලකුණු 03
පැහැදිලි කිරීම ලකුණු 03
මුළු ලකුණු 06

3. (i) A - කොරවක්ගල B - නටරාජා ප්‍රතිමාව C - සත්මහල් ප්‍රාසාදය (1 × 3 = 3)

(ii) P - වැවෙහි අතිරික්ත ජලය පිට කිරීම.
Q - වැව් බැම්මට සිදුවන ජල පීඩනය සමනය කොට සොරොව්වෙන් ජලය පිට කිරීම.
R - වැවෙහි ප්‍රධාන බැම්මට හානියක් සිදු විය හැකි අවස්ථාවක දී වැවෙහි ජලය කොටසක් රඳවා ගැනීමට සමත් විය. වැවේ ප්‍රධාන බැම්මේ ඇති වන ජල පීඩනය අවම කිරීම.
S - වැවට අතුගංගාවලින් එන රොන්මඩ රඳවා ගැනීම. වැවට ජලය හිඟ කාලවලදී කුළුවැවෙහි ඇති ජලය ලබා ගැනීමට හැකිවීම.
(1 × 4 = 4)

[5 වැනි පිටුව බලන්න



(iii)
- බුදු දහමට ජනයා සමීපවීම සමඟ දැහැමි සාමකාමී සන්සුන් ජීවිතයකට හුරු පුරුදු වීම.
- දූමින්දාගමනය සමඟ ලංකාවට පැමිණි විවිධ ශිල්පශ්‍රේණිවල මූලිකත්වයෙන් වාස්තු විද්‍යාත්මක නිර්මාණ, කලාකෘති බිහිවීම.
- විවිධ ඇඳහිලි හා පුදසිරිත්වලට යොමුව සිටි ජනතාවට විධිමත් ආගමක් ලැබීම.
- අක්ෂර මාලාවක්, සාහිත්‍යයක් ලැබීම.

කරුණු 2 ක් සඳහා ලකුණු 02
පැහැදිලි කිරීම ලකුණු 03
මුළු ලකුණු 05

(iv)
- කෘෂි ආර්ථිකයේ ජීවනාලිය වූ වාරිමාර්ග පද්ධතිය විනාශ කර දැමීම හා එය යළි යථා තත්වයට පත් කර ගැනීමට නොහැකි වීම.
- සමාජයට මාර්ගෝපදේශකත්වය ලබා දුන්නා වූ භික්ෂූන් වහන්සේලා රට හැර යාම හා ප්‍රදේශය අතහැර වෙනත් ප්‍රදේශවලට යාම නිසා සමාජ සම්බන්ධතා බිඳ වැටීම.
- ජනතාව වෙනත් ප්‍රදේශ කරා සංක්‍රමණය වීම.
- වාරිමාර්ග පද්ධතිය හා බැඳුණු නිලධාරීන් අභාවයට යාම.
- වසංගත රෝග බෝවීම. (මැලේරියා)
- මාඝ විසින් රජකමට උරුමකම් කිව හැකි සියලුම දෙනා විනාශ කිරීම.

කරුණු 2 ක් සඳහා ලකුණු 02
පැහැදිලි කිරීම ලකුණු 04
මුළු ලකුණු 06

4. (i) ගුත්තිල කාව්‍යය, සැළලිහිණි සන්දේශය, පරෙවි සන්දේශය (1 × 3 = 3)

(ii) දේශපාලන ක්ෂේත්‍රයේ සිදු වූ වැදගත් සිදුවීම්
- උතුරු ලංකාව කෝට්ටේ රාජධානියට ඈඳා ගැනීම. (යාපනය රාජ්‍යය)
- දේශීය කැරළි මැඩ පැවැත්වීම. (ජෝතිය සිටාණන්ගේ කැරැල්ල මැඩලීම)
- දකුණු ඉන්දියාවේ 'අදිවිරරාම' පටුනට පහරදීම.
- වන්නි ප්‍රදේශ යටත් කර ගැනීම.
- විජය නගර් අධිරාජ්‍යයේ තොටුපළක් ආක්‍රමණය කිරීම. (2 × 2 = 4)

(iii) භෞතික පරිසරය වශයෙන් භූ විෂමතාව හා දේශගුණික කරුණු දැක්වීම සඳහා යොදා ගන්න.
- නිරිත දිග ප්‍රදේශයේ රජරට මෙන් තැනිතලා බිම් සීමිත වූ බැවින්, පටු නිම්නවල වී වගාව කිරීම.
- උස් ප්‍රදේශ වී වගාවට සුදුසු නොවූ බැවින්, ගොඩ බෝග වගාව (කුළු බඩු, එළවලු, පළතුරු, පොල්, හේන් වගාව).
- විශාල ජලසම්පාදන ව්‍යාපාර සඳහා භෞතික පරිසරය එතරම් සුදුසු නොවීම නිසා කුඩා ජලසම්පාදන ව්‍යාපාර යටතේ වී වගාව.
- දේශගුණික සාධකවල ප්‍රතිඵලයක් වශයෙන් වර්ෂාපතනය අවුරුද්ද මුලුල්ලේම වාගේ ලැබීම හා ඒ අනුව අහස් දියෙන් බහුල වශයෙන් වී වගාව කිරීම.
- නිරිත දිග වනාන්තරවල ස්වභාවිකව වැවුණු කුරුඳු සහ ගෙවතුවල වවන ලද ගම්මිරිස් වැනි ඇ වෙළඳ බෝග ලෙස එක්රැස් කිරීම.

කරුණු 2 ක් සඳහා ලකුණු 02
පැහැදිලි කිරීම ලකුණු 03
මුළු ලකුණු 05

(iv)
- පාලකයන් අතර පැවති අසමගිය. බුවනකබාහු රජු තම සොහොයුරා ගැන සැකයෙන් හා බියෙන් කටයුතු කිරීම.
- බුවනකබාහු රජු පෘතුගීසින්ගේ සහාය පැතීම.
- කෝට්ටේ රාජ්‍යයෙන් මුස්ලිම්වරු එළවා දමන ලෙස පෘතුගීසින් බුවනකබාහු රජුගෙන් කළ ඉල්ලීමට මායාදුන්නේ රජු තදින් විරුද්ධ වීම නිසා මත ගැටීම්.
- සොහොයුරන් අතර ඇති වූ අර්බුදවලදී බුවනකබාහු පෘතුගීසින්ගෙන් ද මායා දුන්නේ කැලිකට් පාලක සැමොරින්වරුන්ගේ ද සහාය ලබා ගැනීම.
- බුවනකබාහු රජුගේ දියණියගේ පුතුට ආරක්ෂාව හා අධ්‍යාපනය ලබා දීමට පෘතුගීසින්ට පැවරීම.
- ධර්මපාල කුමරු පෘතුගීසින් යටතේ බෞතීස්ම කිරීම.
- උඩරට, කෝට්ටේ සහ යාපන පාලකයන් අතර සමගියක් නොතිබීම.

කරුණු 2 ක් සඳහා ලකුණු 02
පැහැදිලි කිරීම ලකුණු 04
මුළු ලකුණු 06

[6 වැනි පිටුව බලන්න